# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| පළමු වාර පරීක්ෂණය **2018** | 11 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை 2018 | தரம்**11** |
| **First Term Test 2018** | **Grade 11** |

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය I | පැය 1 |
| குடியியற் கல்வி I | 1 மணி |
| **Citizenship Education** | ***One hour*** |

**සැලකිය යුතුයි:**

**(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

**(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

---

(01) අතීතයේ දී ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන පාලන කටයුතු සිදු කළ රාජ්‍යය වන්නේ,

1. ඉන්දියාව 2. ප්‍රංශය 3. ඇතැන්ස් 4. ස්විට්සර්ලන්තය

(02) යුරෝපයේ වැඩවසම් සමාජ ක්‍රමය පැවති කාල සීමාව වන්නේ,

1. ක්‍රි.ව. 2 වන සියවසේ සිට 10 වන සියවස දක්වා ය.
2. ක්‍රි.ව. 5 වන සියවසේ සිට 12 වන සියවස දක්වා ය.
3. ක්‍රි.ව. 8 වන සියවසේ සිට 16 වන සියවස දක්වා ය.
4. ක්‍රි.ව. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා ය.

(03) ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන නූතන රාජ්‍යයක් ලෙස සැලකෙන්නේ,

1. මහා බ්‍රිතාන්‍යයයි. 2. චීනයයි.
3. ඉන්දියාවයි. 4. ඇමෙරිකා එක්සත් ජනපදයයි.

(04) රාජ්‍යයක මූලික ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ජනගහණය, ව්‍යවස්ථාදායක බලය, විධායක බලය, ආණ්ඩුව
2. භූමිය, ජනගහණය, ජනාධිපති, අධිකරණය
3. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය, ආණ්ඩුව
4. භූමිය, ජනගහණය, ආණ්ඩුව, ස්වාධිපතිබලය

(05) රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්ති වලට හැරවීමත්,ඒවා ක්‍රියාවට නැංවීමක් කරනු ලබන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,

1. ආණ්ඩුවයි. 2. ජනාධිපතිවරයායි.
3. අගමැතිවරයායි. 4. කථානායකවරයායි.

(06) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් සමාජය වෙත ඉටු කළ යුතු යුතුකම් වර්ග දෙක වන්නේ,

1. ආර්ථික හා සමාජයීය යුතුකම් 2. නීතිමය හා සදාචාරාත්මක යුතුකම්
3. සිවිල් හා දේශපාලන යුතුකම් 4. ආගමික හා නීතිමය යුතුකම්

(07) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක පවතින ලක්ෂණයකි.

1. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වීම
2. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරීපත් නොවීම.
3. විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකි වීම.
4. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සබඳතාවක් නොපැවතීම

(08) යම් රටක මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලපතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම යනු,

1. බලය බෙදීමයි. 2. බලය පවරා දීමයි.
3. බලය විමධ්‍යගත කිරීමයි. 4. බලය විතැන් කිරීමයි.

(09) ඒකීය රාජ්‍යයක ලක්ෂණයක් වන්නේ,

1. ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයට පැවරීම
2. ලිඛිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
3. මධ්‍යම ආණ්ඩුවේ මෙන් ම ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල පැහැදිලිව ව්‍යවස්ථාව තුළ ඇතුළත් කිරීම.
4. මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක විමධ්‍යගත කරන ලද එම පරිපාලන බලතල නැවත පවරා ගත හැකිවීම.

(10) බ්‍රිතාන්‍යය පාලන යුගය තුළ ලංකාවේ මහ නගර සභා ආඥා පනත සම්මත කරනු ලැබූයේ,

1. ක්‍රි.ව. 1866 වසරේ දී ය. 2. ක්‍රි.ව. 1865 දී ය.
3. ක්‍රි.ව. 1871 දී ය. 4. ක්‍රි.ව. 1870 දී ය.

(11) පළාත් පාලන ආයතනයෙහි ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය ලෙස හැඳින්වෙන්නේ,

1. නගර සභාවයි. 2. ප්‍රාදේශීය සභාවයි.
3. මහ සභාවයි. 4. මහ නගර සභාවයි.

(12) ස්විට්සර්ලන්ත සන්ධීය මහා මණ්ඩලය සමන්විත වන ආයතන දෙක වන්නේ,

1. ජාතික සභාව හා රාජ්‍ය සභාවයි.
2. ජාතික සභාව හා ලෝක් සභාවයි.
3. සෙනෙට් සභාව හා ලෝක් සභාවයි.
4. රාජ්‍ය සභාව හා සෙනෙට් සභාවයි.

(13) බහු සංස්කෘතික සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන වැදගත් ප්‍රතිඵලයකි.

1. රාජ්‍ය භාෂා කිහිපයක් භාවිත කළ හැකිවීම.
2. විවිධ ආගම් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිවීම.
3. එකිනෙකා අභිබවා යැමට පුරුදු වීම.
4. ජන වර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහුවරුවීම.

(14) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බල පෑ සාධකයක් වන වෙළඳාම සඳහා පැමිණි එක් ජාතියකි.

1. බර්ගර් ජාතිය 2. මැලේ ජාතිය
3. අරාබි ජාතිය 4. ජපන් ජාතිය

(15) ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

1. ජලය හා වාතය 2. ආහාර හා වාතය
3. ඖෂධ හා ආහාර 4. ජලය හා හිරු එළිය

(16) භූමිය, ශ්‍රමය. ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක සඳහා කරන ගෙවීම් අනුපිළිවෙලින්,

1. බදු කුලී, වැටුප, පොළිය හා ලාභය වේ.
2. වැටුප, පොළිය, බදු කුලිය හා ලාභය වේ.
3. ලාභය, වැටුප, පොලිය හා බදු කුලී වේ.
4. පොළිය, බදු කුලී, ලාභය හා වැටුප වේ.

(17) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලිය පිළිවෙලින් දැක්වෙන්නේ,

1. නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදාහැරීම වශයෙනි.
2. ගබඩා කිරීම, බෙදාහැරීම. පරිභෝජනය වශයෙනි.
3. නිෂ්පාදනය, බෙදාහැරීම. ගබඩාකිරීම වශයෙනි.
4. නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය වශයෙනි.

(18) "එක් වරක් භාවිතයෙන් අවසන් වීම" විශේෂ ලක්ෂණයක් ලෙස දැක්වෙන භාණ්ඩ වර්ගයකි.

1. පාරිභෝගික භාණ්ඩ 2. අන්තර් භාණ්ඩ
3. ප්‍රාග්ධන භාණ්ඩ 4. තොග භාණ්ඩ

(19) ධනවාදී අර්ථ ක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ,

1. දේපළ අයිතිය රජය සතු වීම
2. නිෂ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශය සතු වීම
3. නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම
4. වෙළඳපොළ මත භාණ්ඩ මිල තීරණය වුව ද රජය ඒ සඳහා මැදිහත් වීම

(20) දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුමෙහි අරමුණක් වන්නේ,

1. නිදහස් වෙළඳාමයි.
2. මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීමයි.
3. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දිරි ගැන්වීමයි.
4. කලාපීය වෙළඳාම පුළුල් කිරීමයි.

(21) ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේ,

1. 1978-1993 කාල සීමාවේදී ය.
2. 1970 - 1970 කාල සීමාවේදී ය.
3. 1964 - 1970 යනකාල සීමාවේදී ය.
4. 1994 - 2004 කාල සීමාවේදී ය.

(22) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක නොවන බලපෑමක් වන්නේ,

1. ආර්ථිකය විවිධාංගිකරණයවීම
2. අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපලින් ඉවත්වීම
3. විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
4. ලෝක ආර්ථිකයේ වෙනස්කම්වලට සෘජුව මුහුණ දීම

(23) පුද්ගලයා තුළ, පුද්ගලයින් අතර, පවුල තුළ , පවුල් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,

1. පවුල් ගැටුම් ලෙස ය.
2. සූක්ෂ්ම ගැටුම් ලෙස ය.
3. සාර්ව ගැටුම් ලෙස ය.
4. කණ්ඩායම් ගැටුම් ලෙස ය.

(24) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන මූලිකම ක්‍රමය කුමක් ද?

1. බේරුම් කරණයයි.
2. සහමන්ත්‍රණයයි.
3. සමථකරණයයි.
4. සාකච්ඡා කිරීමයි.

(25) මැදිහත්කරණය යොදා ගත හැකි අවස්ථාවක් වන්නේ,

1. පොදු දේපළ සම්බන්ධව පවතින ආරවුල්
2. කම්කරු ආරවුල් විසඳීම
3. පාරිභෝගික හා වෙළඳ ආරවුල්
4. පුද්ගල කණ්ඩායම් අතර පවතින ආරවුල් විසඳීම

(26) වර්තමානයේ තේසවලාමේ නීතිය සීමා වී ඇත්තේ,

1. නැගෙනහිර පළාතේ හා කොළඹ දිස්ත්‍රික්කයේ දෙමළ වැසියන්ට ය.
2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචි මුස්ලිම් වැසියන්ට ය.
3. බස්නාහිර පළාතේ හා යාපනය දිස්ත්‍රික්කයේ පදිංචි දෙමළ වැසියන්ට ය.
4. උතුරු පළාතේ හා මන්නාරම් දිස්ත්‍රික්කයේ පදිංචි දෙමළ වැසියන්ට ය.

(27) ලන්දේසි යුගයේ දී ක්‍රියාත්මක වූ ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුන ලෙස පිළිගැනෙන්නේ,

1. යාපනය, අනුරාධපුරය, මහනුවර
2. කොළඹ, යාපනය, ගාල්ල
3. ගාල්ල, මහනුවර අනුරාධපුරය
4. මහනුවර, කොළඹ, යාපනය

(28) 1973 යුක්තිය පසිඳලීමේ පනතට පෙර ශ්‍රී ලංකාවේ ඉහල ම උසාවිය ලෙස පිළිගන්නේ,

1. ශ්‍රේෂ්ඨාධිකරණයයි.
2. රාජාධිකරණයයි.
3. අභියාචනාධිකරණයයි.
4. පළාත්බඳ මහාධිකරණයයි.

(29) අභියාචනාධිකරණය සතු බලතල දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - වාණිජ ආරවුල් විසඳීම

B - ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය

C - කම්කරු විනිශ්චය සභා තීරණ පිළිබඳ අභියාචනා විසඳීම

D - පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය

E - විවිධ ආඥා නිකුත් කිරීමේ බලය

1. BහාC 2. AහාB 3. Dහා E 4. Cහා D

(30) ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම අභියාචනා අධිකරණය ලෙස ක්‍රියාත්මක වන්නේ,

1. අභියාචනාධිකරණයයි. 2. ශ්‍රේෂ්ඨාධිකරණයයි.
3. මහාධිකරණයයි. 4. රාජාධිකරණයයි.

(31) දිසා අධිකරණයේ විනිසුරුවන් පත්කිරීම හා ඉවත්කිරීම සිදුකරනු ලබන්නේ,

1. අගවිනිසුරුතුමා විසිනි.
2. ජනාධිපතිතුමා විසිනි.
3. අධිකරණ සේවා කොමිෂන් සභාව මගිනි.
4. අධිකරණ ඇමතිතුමා ය.

(32) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිධූරය දරනු ලබන්නේ,

1. සොලිසිටර් ජනරාල්තුමා ය.
2. අග්‍රවිනිශ්චයකාරතුමා ය.
3. නීතිපතිතුමා ය.
4. අධිකරණ ඇමතිතුමා ය.

(33) A - අතිරේක සොලිස්ටර් ජනරාල්

B - අග විනිසුරුතුමා

C - ඔම්බුඩ්ස්මන්වරයා

D - රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතීඥවරුන්

E - අභියාචනාධිකරණ සභාපතිවරයා

ශ්‍රී ලංකා නීතිපතිතුමාගේ බලතල හා කාර්යයන් ඉටුකිරීම සඳහා සහාය වන නිලධාරීන් දෙදෙනෙක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. B හා C 2. A හා B 3. D හා E 4 . A හා D

(34) පහළ අධිකරණවල විනිසුරුවන් පත්කිරීම සිදු කරනු ලබන්නේ,

1. අධිකරණ සේවා කොමිෂම මගිනි.
2. ජනාධිපතිවරයා මගිනි.
3. අධිකරණ ඇමතිතුමා මගිනි.
4. අගවිනිසුරු තුමා මගිනි.

(35) පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

- ඩොමිනියන් තත්වය අහෝසි කර ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම.
- ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම උසාවිය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගැනීම

ඉහත වෙනස්කම් සිදු කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද?

1. 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව
2. 1948 සෝල්බරි ව්‍යවස්ථාව
3. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව
4. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව

(36) මූලික අයිතිවාසිකම් හඳුන්වාදීම හා ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධි විධාන ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම සිදු වූයේ,

1. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.
2. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.
3. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනි.
4. 1921 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

(37) උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කයක් වන්නේ,

1. මඩකලපුව 2. අම්පාර
3. ත්‍රිකුණාමලය 4. මුලතිව්

(38) ආණ්ඩුවේ ක්‍රියා මාර්ග සාධාරණව විවේචනය කිරීම සිදු වන්නේ,

1. අධිකරණයෙනි.
2. කැබිනට් මණ්ඩලයෙනි.
3. ව්‍යවස්ථාදායක මගිනි.
4. විපක්ෂය තුළිනි.

(39) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රී සංඛ්‍යාව

1. 196 කි. 2. 229 කි. 3. 129 කි. 4. 225 කි.

(40) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති පොදු උපයෝගීතා සේවාවකි.

1. මංමාවත් ආරක්ෂා කිරීම
2. මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීම
3. අහිතකර ගොඩනැගිලි ඉවත් කිරීම
4. මහජන වෙළෙඳපල පවත්වා ගැනීම